# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**
**2017 අප්‍රේල් - ජූනි**
**සමාජීයවිද්‍යා පීඨය**

**මනෝවිද්‍යාව - PSYC – E 2035**

**ඉගෙනුම පිළිබඳ මනෝවිද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "ඉගෙනුම" (Learning) යනු කුමක්දැයි නිර්වචනය කර එහි අනිවාර්ය ලක්ෂණ නිදසුන් සමගින් පැහැදිලි කරන්න.

02. සම්භාව්‍ය ආරෝපණ ඉගෙනුම් න්‍යායයට අනුව "ඉගෙනුම" සිදුවන ආකාරය කෙටියෙන් හඳුන්වා සම්භාව්‍ය ආරෝපණ මූලධර්ම (Principles ) උදාහරණ සහිතව පහදන්න.

03. උපස්ථම්භන / ප්‍රතියත්ත ( Reinforcement) හා දඬුවම් ( Punishment) යන සංකල්ප හා ඒවායේ ප්‍රභේද විස්තර කර ඉගෙනුම සම්බන්ධයෙන් ඒ සංකල්පයන්ගේ උපයෝගිතාව පෙන්වා දෙන්න.

04. "තැත්වරද ඉගෙනුම" (Trial & error Learning) හා ඉගෙනුම සම්බන්ධයෙන් ඊ.එල් තෝන්ඩයික් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති රීති (Laws/Rules) මොනවාදැයි පැහැදිලි කරන්න.

05. ඉගෙනුම කෙරෙහි බලපාන පුද්ගලබද්ධ (ඉගෙනුම්කරු සම්බන්ධ) සාධක ලයිස්තුවක් සකසා ඔබ කැමති ඕනෑම පුද්ගලබද්ධ සාධක 05 ක් ඉගෙනුම කෙරෙහි බලපාන ආකාරය පහදන්න.

06. "ඉගෙනුම් කුසලතා" ( Learning skills) යනු කුමක්දැයි හඳුන්වා ඉගෙනුම සාර්ථක කරගැනීමට ඒවා උපයෝගි කරගත හැකි ආකාරය තුලනාත්මකව පෙන්වා දෙන්න.

07. මතකය වර්ධනය කර ගැනීම සඳහා ඉගෙනුම්කරුවකු විසින් අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හෝ ක්‍රම ශිල්ප යෝජනා කරන්න.

08. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකකට (02) සටහන් ලියන්න.
    i. උපස්ථම්භන /ප්‍රතියත්ත කාලරාමුව
    ii. උත්තේජ-ප්‍රතිචාර ඉගෙනුම හා ප්‍රතිචාර -උත්තේජ ඉගෙනුම
    iii. නිරීක්ෂණ / නිරීක්ෂණමය ඉගෙනුම
    iv. සම්භාව්‍ය හා ප්‍රකාරක ආරෝපණයන්ගේ සමවිෂමතා
    v. විභාග කුසලතා

*********************